මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගම - 2022

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ආස්ථිත්වයන් (SMEs) සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමාණ ආස්ථිත්වයන් (SMEs) සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

-

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 2.52 වගන්තියට අනුකූල නොවන පරිදි පහත සඳහන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් හිලව් කර ගිණුම් තබා තිබුණි. I සමාගමට පෞද්ගලික සමාගමක් වෙතින් ලැබිය යුතු රු. 42,132,000 ක ශේෂයකට එම සමාගම වෙත ගෙවිය යුතු රු. 18,732,000 ක ශේෂය හිලව් කර එම සමාගමෙන් ලැබිය යුතු මුදල ලෙස රු. 23,400,000 ක් මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර තිබුණි. II සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ඉමල්ෂන් අලෙවියෙන් ලැබිය යුතු රු.8,731,355 ක ශේෂයට සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.7,697,175 ක් හිලව් කර මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල රු.1,034,180 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත.	ප්‍රමිතිය මගින් අවසරය ලබා දී නොමැති වත්කම් හා වගකීම් හිලව් කිරීමට කටයුතු නොකළ යුතුය.

(ආ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 4.7 වගන්තියට අනුකූල නොවන පරිදි වර්ෂ 18 කට පෙර එනම් 2004 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොටස් ප්‍රාග්ධනය ලෙස මෙම සමාගමට ලබා දුන් රු.1,000,000 ක් මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ වාර්තා කර තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත.	ප්‍රමිතියට අනුකූලව ජංගම වගකීම් වර්ගීකරණයට අදාළ නොවන අගයන් ඉවත් කර ජංගම වගකීම් වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 17.15C වගන්තියට අනුකූල නොවන පරිදි සමාලෝචිත වසර තුළ මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් ලැබූ ලාභය වූ රු.13,025,000 ක් හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ රඳවා ගත් ඉපැයීම් යටතේ දක්වා තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත.	මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කළ යුතුය.
(ඈ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 18.27 වගන්තියට අනුගත ව පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංග පද්ධතියේ වටිනාකම ගිණුම්ගත කිරීමට හා අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකිරීමටද කටයුතු කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	පරිගණක මෘදුකාංග පද්ධතිය අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය.
(ඉ)	සමාගම විලම්භිත බදු ගණනය කිරීමේ දී 30% ක් වූ ආදායම් බදු අනුපාතිකය 18% ක් ලෙස සැලකීම, ප්‍රත්‍යාගණන ලාභය ගෙන නොතිබීම හා පාරිතෝෂික බදු බැරකමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් රු.514,780 ක් විලම්භිත බදු වත්කමක් ලෙස හඳුනා ගෙන තිබූ වටිනාකම විගණනය විසින් කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 29.7ට අනුකූලව සිදු කල ගණනය කිරීම් අනුව එම විලම්භිත බදු වගකීම රු.820,920 කි. ඒ අනුව විලම්භිත බදු රු.1,335,700 ක් අඩුවෙන් දක්වා තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	විලම්භිත බදු වගකීම ප්‍රමිතියට අනුව නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් හි 10.23 වගන්තියට අනුකූල වන පරිදි, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ සඳහන් රු.5,493,814 ක පෙර වර්ෂයේ ගැලපීම් සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	ප්‍රමිතිය ප්‍රකාරව පෙර වර්ෂ ගැලපීම්වලට අදාළ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයේ සිදු කළ යුතුය.

(උ)	කුඩා සහ මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයෙහි 33 වගන්තියට අනුකූල වන පරිදි සම්බන්ධිත පාර්ශවයන් වන සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර ගනුදෙනු, සමාගම සහ මග නැගුම උපදේශන සමාගම / මග නැගුම මාර්ග ඉදිකිරීම් සමාගම අතර ගනුදෙනු, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ බඳු ගිවිසුම් හා සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරිය අතර මිල කරණ ප්‍රතිපත්තිය සහ අනෙකුත් ඇපකර වලට අදාළ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුලත් කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	සම්බන්ධිත පාර්ශ්වයන් අතර ගනුදෙනුවලට අදාළ තොරතුරු ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන අනුව තොගයේ වටිනාකම රු.62,142,477ක් වූ අතර භෞතික තොග සත්‍යාපන වාර්තා විගණනය වෙත ලබා දී නොතිබුණි. තවද, මාසික තොග වාර්තා වල වටිනාකම හා ගිණුමේ වටිනාකම අතර රු.429,427ක වෙනසක්ද නිරීක්ෂණය වූ බැවින් තොග වටිනාකමේ නිරවද්‍යතාවය පිලිබඳ විගණනයේදී අවිනිශ්චිතතාවයක් පැවතුනි.	අදහස් ඉදිරිපත් කර නොමැත	භෞතික තොග සත්‍යාපනය වාර්ථා විගණනය වෙත ලබා දීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	සමාගම විසින් තවදුරටත් භාවිතා කරනු ලබන රු.17,991,717 ක දේපළ, පිරියත් හා උපකරණ වල ධාරණ අගය ශූන්‍ය වුවද එම වත්කම් වල ජීව කාලය සංශෝධනය කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	තවදුරටත් භාවිතා කරන, ධාරණ අගය ශූන්‍ය වූ වත්කම්වල ජීව කාලය සංශෝධනය කර සාධාරණ අගයට ගිණුම් ගත කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මාර්ග සංවර්ධන අධිකාරියේ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සැසඳීමේදී පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය වුවද, මෙම ශේෂයන් අතර සැසඳීම් සිදුකර නිවැරදි කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අතර පවතින වෙනස්කම් සැසඳීම් කර සනාථන මඟින් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.

	අයිතමය	සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.	මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.	වෙනස
1	ඉමල්ෂන් අලෙවියෙන් ලැබිය යුතු ශේෂය	8,731,353	4,589,093	4,142,260
2	අත්තිකාරම්	7,697,174	9,798,822	2,101,648
3	ගෙවිය යුතු පිරියත උපකරණ කුලී ගාස්තු	3,412,145	3,230,227	181,918
4	ගෙවිය යුතු කුලී	-	32,090,912	32,090,912

1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමෙන් පසු ලබා දී තිබුණු 2023 මාර්තු 28 දිනැති අංක 23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත මෙම සමාගම ඈවර කිරීමට කටයුතු කළ යුතු වුවද විගණිත දින දක්වා එම කාර්යය සිදු කර නොමැති අතර ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය.	අදහස් ඉදිරිපත් කර නොමැත.	මූල්‍ය ප්‍රකාශන තුළ සමාගමේ අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාව පිළිබඳ හෙළිදරව් කළ යුතුය.
(ආ)	යථෝක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගම ඈවර කිරීම සඳහා ඈවරකරුවෙකු වශයෙන් පෞද්ගලික සමාගමක් පත් කිරීමට 2023 අගෝස්තු මස 7 දින සමාගමේ අති විශේෂ වාර්ෂික මහ සභා රැස්වීමේදී ඒකමතික යෝජනාවක් සම්මත කර තිබුණද, රාජ්‍ය මුදල් ආයෝජනය කර සංස්ථාපනය කරන ලද මෙම සමාගමේ වත්කම් වලින් හරි අඩකට සමාගමේ පෞද්ගලික කොටස් හිමියා මෙන්ම සමාගමේ සභාපති හිමිකම් පෑම ගැටළුකාරී තත්ත්වයක් බැවින් මෙම ඈවරකරු පත් කිරීම අත්හිටුවීමට 2023 සැප්තැම්බර් 07 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාගම වෙත දැනුම් දී තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත.	2007 අංක 07 දරණ සමාගම් පනතේ 187(1) වගන්තිය අනුව සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් බලතල ක්‍රියාත්මක කරන හෝ කාර්යය ඉටු කරන තැනැත්තෙකු සත්භාවයෙන් සමාගම සම්බන්ධතා උදෙසා ඒ තැනැත්තා විශ්වාස කරන ආකාරයටද ක්‍රියාකල යුතු අතර සමාගමේ වත්කම්වල

			හිමිකාරත්වය නිරවුල් කර ගැනීමට හා අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට නොපමාව කටයුතු ද කළ යුතුය.
(ඇ)	යථෝක්ත තීරණය මත ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය පදනම්ව සමාගමේ සේවකයන් ඉවත් කර තිබුණි. එසේම ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන තෙක් අත්‍යාවශ්‍ය රාජකාරි ඉටු කිරීම සඳහා 2023 අගෝස්තු 7 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත දෛනික වැටුප් ක්‍රමය යටතේ නිලධාරීන් 07 දෙනෙකු නැවත සේවයට බඳවා ගෙන තිබුණද, වර්තමානයේ දී සමාගම් පරිපාලන කටයුතු සඳහා කාර්යාලයක් නොතිබුණු අතර කිසිදු සේවකයෙකු සේවයට වාර්තා නොකිරීමේ තත්වයක් මත විගණනයට අවශ්‍ය පොත්පත්, ලිපි ගොනු, තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට නොහැකි විය.	අදහස් ඉදිරිපත් කර නොමැත	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 07 හා 38(1)(ආ) වගන්තීන්ට අනුකූලව පොත් පත් හා ලේඛන පවත්වා ගෙන යාමට සහ තහවුරු කිරීම් සඳහා නියමිත තොරතුරු නියමිත කාල සීමාවන්හිදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කලයුතුය.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	වටිනාකම රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාරිතෝෂික වෙන් කිරීම්	10,866,300	පාරිතෝෂික වෙන් කිරීම් අගය ගණනය කල ආකාරය	අදහස් ඉදිරිපත් කර නොමැත	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 07 හා 38(1)(ආ) වගන්තීන්ට අනුකූලව පොත් පත් හා ලේඛන පවත්වා ගෙන යාමට සහ තහවුරු කිරීම් සඳහා නියමිත තොරතුරු නියමිත කාල සීමාවන්හිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කලයුතුය.
(ආ)	ලැබිය යුතු වැට් බදු	731,154	ලැබිය යුතු වැට් බදු වටිනාකමට අදාළ ගණනය කිරීම්	අදහස් ඉදිරිපත් කර නොමැත	
(ඇ)	සමාගමට අදාළව පවතින නඩු	43,948,644 23,400,000 164,400,000	CHC/299/2016/MR CHC/298/2016/MR CHC/594/15/R නඩු ලිපිගොනු හා නඩු වල වර්තමාන තත්ත්වය.	අදහස් ඉදිරිපත් කර නොමැත	
(ඈ)	සමාගම විසින් පෞද්ගලික සමාගමක් වෙත 2013 වසරේ සිට ගෙවීමට ඇති ශේෂය	24,500,000	ශේෂය තහවුරු කිරීමේ ලේඛන	අදහස් ඉදිරිපත් කර නොමැත	

(ඉ)	2015 වර්ෂයේ යෝජිත ලාභාංශ	29,765,787	ලාභාංශ ප්‍රකාශ කිරීම සනාථ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හෝ වාර්ෂික මහසභා රැස්වීම් වාර්තා.	අදහස් ඉදිරිපත් කර නොමැත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 07 හා 38(1)(ආ) වගන්තීන්ට අනුකූලව පොත් පත් හා ලේඛන පවත්වා ගෙන යාමට සහ තහවුරු කිරීම් සඳහා නියමිත තොරතුරු නියමිත කාල සීමාවන්හිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කලයුතුය.
(ඊ)	සමාගම පිහිටා ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් අක්කර 2 ක් සහ පර්චස් 9.83 ක ඉඩමෙහි තක්සේරු වටිනාකම	9,620,000	ඉඩම සහ ගොඩනැගිලි සඳහා බදු ගිවිසුම		
(උ)	මෝටර් රථ ප්‍රත්‍යාගණනය	13,025,000	මෝටර් රථ ප්‍රත්‍යාගණන වාර්තාව		
(ඌ)	ගොඩනැගිලි අලුත්වැඩියාව	3,483,255	විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් හා 2022.12.31 දිනට ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාව		
	කාර්යාලීය උපකරණ	4,906,138			
	ගෘහ භාණ්ඩ	4,100,849			
	යන්ත්‍රෝපකරණ	11,725,250			

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 7 දරන සමාගම් පනත 133 වගන්තිය	සමාගමක් විසින් සෑම ලිත් වර්ෂයකටම වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවිය යුතු වුවත්	අදහස් ඉදිරිපත් කර නොමැත	සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය

		2016 වසරින් පසු වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.		යුතුය.
(ආ)	2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED 01/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන වගන්තිය	වෙන්කල වාහනයකට හිමිකම් ඇති නිලධාරියෙකුට නිල වාහනය භාවිතා කිරීම වෙනුවට මාසිකව රු.50,000 ක දීමනාවක් ගෙවිය හැකි නමුත් සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් හතර දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.2,925,000ක් ගෙවීම් කර තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වගන්තිය	වැටුප් ගෙවීමේදී සේවකයින්ගේ රැකියා ආදායම මත සේවා යෝජකයන් විසින් උපයන විට බදු අඩු කළ යුතු නමුත් සේවකයින්ගේ වැටුපෙන් අය කිරීමකින් තොරව සමාගම විසින් උපයන විට බදු ලෙස රු. 123,813 ක් ගෙවා තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට හා ඊට අනුකූල නොවන ලෙස අදාළ ගෙවීම් නිර්දේශ කර, සහතික කර, අනුමත කරන ලද නිලධාරින්ගෙන් එම මුදල් අය කර ගැනිමට නෙපමාව කටයුතු කල යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අංක 580 හි 10 හා 11 වගන්ති	කළමනාකරණ නියෝජන ලිපිය විගණනයට ඉදිරිපත් කල යුතු නමුත් සමාගම විසින් එසේ කටයුතු කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව ලිඛිත නියෝජනයක් විගණනයට ලබා දිය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,895,016 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.6,650,715 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.45,545,731 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉමල්ෂන් නිෂ්පාදන විකුණුම් ආදායම රු.139,203,601 කින් අඩුවීම හා මූල්‍ය වියදම රු.4,598,612 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ ආදායම පෙර වර්ෂයේ ආදායම සමඟ සැසඳීමේ දී සියයට 59 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඊට අනුරූපීව විකුණුම් පිරිවැය ද සියයට 51 කින් අඩු වී තිබුණි. එසේම දළ ලාභය ද සියයට 84 කින් අඩු වි තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් පෙර වර්ෂයේ වෙනත් ආදායම් සමඟ සැසඳීමේ දී සියයට 241 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය පිරිවැය පෙර වර්ෂයේ මූල්‍ය පිරිවැය සමඟ සැසඳීමේ දී සියයට 182 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. අයිරා පොලී වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේ සමාගමේ ජංගම වත්කම් අනුපාතය පෙර වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය සමඟ සැසඳීමේ දී 1.35 සිට 1.50 දක්වා වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී 1 සිට 0.50 දක්වා අඩු වීමක් නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ දළ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 9 ක් හා සියයට 23 ක් වූ අතර පසුගිය වර්ෂයේ දී ශුද්ධ ලාභ අනුපාතය සියයට 3ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය සියයට 37ක සෘණ අගයක් ගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සංවර්ධන අධිකාරිය සතු සමාගමක් වශයෙන් ක්‍රියා කරන ලද මාර්ග නිර්මාණ හා සංවර්ධන පෞද්ගලික සමාගම (RC & DC) මුළුමනින් ම වසා දැමීමටත්, පෞද්ගලික පොදු සමාගමක් පිහිටුවීමේ හැකියාව පිළිබඳ ව මහාමාර්ග අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් පරීක්ෂා කර බැලීම සඳහාත් 2004 ජනවාරි 21 දින පැවති අංක: අමප/04/0053/104/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණ ද ඊට අනුකූල නොවන පරිදි මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහ නැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගම සංස්ථාපනය කර තිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	රජයේ නීතිරීති, අමාත්‍යමණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.
(ආ)	2004 අගෝස්තු 27 දිනැති අංක 04/0848/004/013-I දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිකිරීම් කර්මාන්ත සංගමය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ජාතික සංගමය සමඟ හවුල්කාරිත්වයකට එළඹීමෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සතු අතුරු සමාගම් තුනක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දී තිබු නමුත් එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ අංක 795/2004 දරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත 2004	අදහස් ඉදිරිපත් කර නොමැත	රජයේ නීතිරීති, අමාත්‍යමණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.

	ජුනි 10 වන දින සමාගම සංස්ථාපනය කර තිබීම.		
(ඇ)	සමාගමේ ප්‍රාග්ධන දායකත්වය සඳහා රු.100 බැගින් කොටස් 02 ක් මාර්ග සංවර්ධන අධිකාරියට හා සමාගමේ සභාපතිවරයාට නිකුත් කර තිබුණද, එම කොටස් සඳහා සමාගමට මුදල් ගෙවා නොතිබුණි. මීට අමතරව ප්‍රාග්ධන දායකත්වය ලෙස 2004 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලබා දුන් රු.1,000,000 ක් සඳහා, මේ දක්වා සමාගම කොටස් නිකුත් කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	සමාගමේ ප්‍රාග්ධන දායකත්වය සඳහා කොටස් නිකුත් කිරීම හා නිකුත් කළ කොටස් සඳහා මුදල් අය කර ගැනීම අදාළ නීති රීති හා ගිවිසුම් ප්‍රකාරව සිදු කළ යුතුය.
(ඈ)	සමාගමේ බහුතර අයිතිය භාණ්ඩාගාරයට පැවරෙන පරිදි ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම සඳහා 2013 පෙබරවාරි 18 දිනැති අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණ ද, එම කැබිනට් තීරණයට අනුව සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කර නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	රජයේ නීතිරීති, තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම සතු පැයකට ලීටර් 10,000 ක නිෂ්පාදන ධාරිතාවයෙන් යුක්ත ඉමල්ෂන් යන්ත්‍රාගාරය අවම දිනකට පැය 5 බැගින් දින 20 ක් නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදීම තුලින් වාර්ෂිකව ඉමල්ෂන් ලීටර් මිලියන 12ක නිෂ්පාදන ධාරිතාවයක් පවත්වාගත හැකි බවට පුරෝකථනය කලද, 2020 වර්ෂයේ සිට 2023 ජුලි දක්වා එහි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර් 766,000 ක්, ලීටර් 2,633,300 ක්,ලීටර් 418,500 ක් හා ලීටර් 950,500 ක් පමණක් විය.	අදහස් ඉදිරිපත් කර නොමැත	යන්ත්‍රාගාරයේ උපරිම හා අවම ධාරිතා මට්ටම් නිශ්චය කර ගැනීම හා ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් රජයේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉමල්ෂන් අවශ්‍යතාවය විශ්ලේෂණය කර සමාගම වෙත උපරිම ඇනවුම් ප්‍රමාණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාගම වසා දැමීම හේතුවෙන් 2023 ඔක්තෝම්බර් 20 දින සිට මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මෙම යන්ත්‍රාගාරය නැවත භාරගෙන තිබුණද මේ වන තෙක් යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු සිදු නොවීම නිසා දැනට පූර්ණ වශයෙන්ම යන්ත්‍රාගාරය ඌන උපයෝජිතව පවතී.	අදහස් ඉදිරිපත් කර නොමැත.	රාජ්‍ය සම්පත් ප්‍රශස්ථ මට්ටමින් ඵලදායි ලෙස භාවිතා කරමින් නාස්තිය අවම කර ගැනීමට කටයුතු කළ යුතුයි.

3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ ප්‍රාග්ධන දායකත්වයෙන් වැඩි කොටසක් හා සමාගමේ මෙහෙයුම් සඳහා භාවිත කරන ස්ථාවර වත්කම්වලින් විශාල ප්‍රතිශතයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සපයා තිබුණද මාර්ග සංවර්ධන අධිකාරියට පරිපාලක සමාගම වශයෙන් 2004 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලබා දී නොතිබුණි.	අදහස් ඉදිරිපත් කර නොමැත	සමාගම විසින් භාවිතා කරන ස්ථාවර වත්කම්වල ප්‍රාග්ධන පිරිවැය හා සමාගමේ කොටස් හිමියන් වෙත ගෙවිය යුතු ප්‍රතිලාභ නිවැරදිව ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුය.